# <u>WEATHER FORECAST FOR 20 AUGUST 2019</u>
## <u>(Issued at 1200 noon on 19 August 2019)</u>

**Showery condition in South-western part of the island is expected to enhance to some extent during next few days.**

Showers or thundershowers will occur at Northern, Western, Central, Sabaragamuwa and North-western provinces and in Galle and Matara districts.

Showers or thundershowers will occur at several places elsewhere, particularly Eastern province and in Badulla district after 2.00 pm.

Heavy falls about 100 mm are likely at some places in Western and Sabaragamuwa provinces and in Galle and Matara districts. Fairly heavy falls above 50 mm are likely at some places in Batticaloa and Ampara districts.

**There may be temporary localized strong winds during thundershowers. General public is kindly requested to take adequate precautions to minimize damages caused by lightning activity.**

දිවයිනේ නිරිතදිග කොටසේ වැසි තත්වයේ තරමක වැඩි වීමක් ඉදිරි දින කිහිපයේදී බලාපොරොත්තු වේ.

උතුරු, බස්නාහිර, මධ්‍යම, සබරගමුව සහ වයඹ පළාත්වලත් ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවලත් වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ.

සෙසු පළාත්වල, විශේෂයෙන් නැගෙනහිර පළාතේ සහ බදුල්ල දිස්ත්‍රික්කයේ තැනින් තැන සවස 2.00 න් පමණ පසුව වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ.

බස්නාහිර සහ සබරගමුව පළාත්වලත් ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවලත් ඇතැම් ස්ථාන වලට මි.මී. 100 ක පමණ තද වර්ෂාපතනයන්ද, මඩකලපුව සහ අම්පාර දිස්ත්‍රික්කවල ඇතැම් ස්ථාන වලට මි.මී. 50 ට වැඩි තරමක තද වර්ෂාපතනයන්ද ඇති විය හැක.

ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැක. අකුණු මඟින් සිදුවන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

## <u>WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS (Issued at 1200 noon on 19 August 2019)</u>

Showers or thundershowers will occur in the sea area extending from Puttalam to Hambantota via Colombo and Galle. Fairly heavy showers can be expected at some places.

Showers or thundershowers will occur in the sea area extending from Mannar to Mullaitivu via Kankasanturai.

Showers or thundershowers may occur at few places in the other sea areas around the island in the evening or night.

Winds will be South-westerly and speed will be (30-40) kmph in the sea areas around the island.

The sea area extending from Hambantota to Pottuvil can be very rough at times as the wind speed can increase up to (60-65) kmph at times and the sea area extending from Puttalam to Trincomalee via Mannar and Kankasanturai can be rough at times as the wind speed can increase up to 60 kmph at times.

**Temporarily strong gusty winds and rough seas can be expected during thundershowers.**

**Naval and fishing communities are requested to be vigilant in this regard.**

## <u>ඉදිරි පැය 24 සඳහා දිවයින වටා ඇති මුහුදේ කාලගුණ තත්ත්වය</u>
## <u>2019 අගෝස්තු මස 19 දින මධ්‍යහන 1200 ට නිකුත් කරන ලදි.</u>

පුත්තලම සිට කොළඹ සහ ගාල්ල හරහා හම්බන්තොට දක්වා වන මුහුදු ප්‍රදේශවල වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවන අතර ඇතැම් මුහුදු ප්‍රදේශවල තද වැසි ද අපේක්ෂා කළ හැක.

මන්නාරම සිට කන්කසන්තුරය හරහා මුලතිවු දක්වා වන මුහුදු ප්‍රදේශවලද වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ.

දිවයින වටා වන සෙසු මුහුදු ප්‍රදේශවල සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී ස්ථාන ස්වල්පයක වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති විය හැක.

දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල සුළං නිරිත දෙසින් හමා එන අතර සුළගේ වේගය පැ.කි.මී. (30-40) පමණ වේ.

හම්බන්තොට සිට පොතුවිල් දක්වා මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය පැ.කි.මී. (60-65) දක්වා ඉහල යාමට හැකියාවක් පවතින අතර එම මුහුදු ප්‍රදේශ විටින් විට ඉතා රළු විය හැක. පුත්තලම සිට මන්නාරම සහ කන්කසන්තුරය හරහා ත්‍රිකුණාමලය දක්වා මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට පැ.කි.මී. 60 දක්වා වැඩි විය හැකි අතර එම මුහුදු ප්‍රදේශ විටින් විට රළු විය හැක.

ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව රළු විය හැක.

ධීවර සහ නාවුක ප්‍රජාව මේ පිළිබඳව ඉතා අවධානයෙන් කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

කාලගුණ විද්‍යාඥ (Duty Meteorologist),
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව (Department of Meteorology)

EMERGENCY OPERATIONS DIVISION
RECEIVED
Date: 2019/8/19
Time: 12.15
D (Ops)/DO/ADO
DISASTER MANAGEMENT CENTRE